සංස්ථාපිත මණ්ඩලයේ පොදු පරමාර්ථ

3. (1) සංස්ථාපිත මණ්ඩලය පිහිටුවනු ලබන්නේ යම් පොදු පරමාර්ථ සඳහා ද, ඒ පොදු පරමාර්ථ පහත දැක්වෙන පරිදි විය යුතු යැයි මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ:—

(අ) ථෙරවාද බෞද්ධ දර්ශනය ඇතුළත් බෞද්ධ සම්ප්‍රදයන් ප්‍රවර්ධනය කිරීම;

(ආ) ජාතික හා ජාත්‍යන්තර බෞද්ධ සම්ප්‍රදයන් ප්‍රවර්ධනය සහ සමාන්තර සංවිධාන සමග ඒකාබද්ධව බෞද්ධාගමික සේවාවන් ඉදිරියට ගෙනයාම;

(ඇ) භාවනා / යෝගා පුහුණුව ලබා දීමට දිවයින පුරා ශාඛා ව්‍යාප්ත කිරීම;

(ඈ) සුනාමි, ගංවතුර වැනි ජාතික ව්‍යසනයන්ට ලක්වූවන්ට ආධාර ලබා දීම;

(ඉ) තරුණ තරුණියන්ගේ නායකත්වය හා පෞරුෂ වර්ධනය කිරීම තුලින් ස්වකීය අභිමානය ඔප් නංවන කුසලතා සංවර්ධනයට අදාළ වෘත්තීය පුහුණු අවස්ථා සැලසීම;

(ඊ) තරුණ ශ්‍රමය හා තරුණ ජවය කාර්යක්ෂම හා ඵලදායී ලෙස ජාතික අභිවෘධිය සඳහා යොදවා ගැනීමට අවශ්‍ය පහසුකම් සැපයීම හා ඊට දයක වීම;

(උ) තිරසාර සංවර්ධන සමාජයක් සඳහා කායික, මානසික හා අධ්‍යාත්මික සුවපත් සමාජයක් වෙනුවෙන් නොමිලේ යෝග භාවනා වැඩසටහන් සංවිධානය කිරීම;

(ඌ) අධ්‍යාපන පහසුකම්වලින් තොර දුප්පත්කමින් පසුවන ළමා, තරුණ පිරිස් සඳහා අධ්‍යාපන කටයුතු සහ පෙර පුහුණු කටයුතු සංවිධානය කිරීම, පවත්වාගෙන යාම සහ වැඩි දියුණු කිරීම ද පොදුජන සුභසාධනයට තරුණ ශ්‍රමය යොමු කිරීම ද ගොවීන් දිරිගැන්වීම හා තරුණ ගොවි සංවිධාන ඇති කිරීම;

(එ) ප්‍රාග් වෘත්තීය අධ්‍යාපන පුහුණුව, ක්‍රීඩා ක්ෂේත්‍රයේ පුහුණුව හා නායකත්වය, පරිගණක, ජනසන්නිවේදනය, දමිළ, ඉංග්‍රීසි හා වෙනත් භාෂා පුහුණුවට ඉඩ ප්‍රස්ථා ලබා දීම;

